# විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් සභා රාජ්‍ය සේවයක්

## පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත

## மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு – மேல் மாகாணம்

## PROVINCIAL COUNCIL PUBLIC SERVICE COMMISSION – WESTERN PROVINCE

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය | இல.628, 10 வதுமாடி, ஜனஜயசிட்டிவளாகம், நாவலவீதி, ராஜகிரிய | No.628,10th Floor,Jana Jaya City Building,Nawala Road,Rajagiriya


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | WPC/PSC/EXM/02/MSO-III/EB/2026 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.11. 27 |

ප්‍රධාන ලේකම් (බ.ප.),
ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.)

**<u>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී (III ශ්‍රේණිය) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2026 සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවීම</u>**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී (III ශ්‍රේණිය) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2026 වෙනුවෙන් ඇමුණුම 01හි සඳහන් 2025.11.27 දිනැති නිවේදනය මගින් අයදුම්පත් කැඳවා ඇත.

02. ඒ සඳහා අයදුම්කරනු ලබන සුදුසුකම්ලත් අයදුම්කරුවන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk ඔස්සේ මාර්ගගත ක්‍රමය මගින් (Online) **<u>2025.12.17</u>** දිනට පෙර අයදුම් කළ යුතු අතර, එම අයදුම්පත්වල මුද්‍රිත පිටපත් **<u>2025.12.31</u>** දිනට පෙර නියමිත ධූරාවලිය ඔස්සේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය. මෙම දින වලින් පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මේ සම්බන්ධයෙන් ඔබ කාර්යාලයේ හා ඔබ යටතේ වන කාර්යාලවල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්, මෙම පරීක්ෂණයට පෙනී සිටීමට අයදුම්කරුවන් නොමැත්තේ නම් ඒ බවද දන්වා එවීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.


Tel – 0112879614
Fax – 0112879512
Email – ppscwpexm@sltnet.lk

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී (III ශ්‍රේණිය)**
**පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2026**

➢ **සැලකිය යුතුයි - සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමය (Online) යටතේ පමණක් අයදුම්කළ යුතුය.**

01. උක්ත විභාගය යථා කාලයේදී බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන අතර එම දිනය පිළිබඳ තොරතුරු අයදුම්කරුවන්හට නිල කෙටි පණිවුඩයක් මගින් දන්වා එවනු ලැබේ.

02. <u>යෝග්‍යතාව</u>

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී III ශ්‍රේණියේ නිලධාරීහු පමණක් මෙම විභාගය සඳහා පෙනී සිටීම සඳහා සුදුස්සෝ වෙති.

03. විභාගයට පෙනී සිටීම සඳහා සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ පමණක් අයදුම්කළ යුතුය. එසේ අයදුම් කිරීමෙන් පසු යොමු අංකය සහිත මුද්‍රිත පිටපත ආයතන ප්‍රධානියා මගින් ධූරාවලිය ඔස්සේ අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනට පෙර එවීමට කටයුතු කළ යුතුය.

(අ) <u>**2025.12.17**</u> දින හෝ ඊට පෙර මාර්ගගත (Online) ක්‍රමය යටතේ අයදුම් කරන ලද අයදුම්පත්‍රයන්හි මුද්‍රිත පිටපත <u>**2025.12.31**</u> දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප), අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල රාජගිරිය" යන ලිපිනයට තම දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම් (බ.ප), මගින් එවිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

සටහන : අයදුම්පත්‍ර බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ හෝ මෙම කාර්යාලයේ වෙනත් නිළධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුයි.

(ආ) මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. කිසියම් ඉල්ලුම්පත්‍රයක් තැපැලෙන් නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

04. උපදෙස් වලට අනුකූලව නිවැරදි යොමු අංකයක් සහිතව මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්කරන ලද අපේක්ෂකයන්ට <u>www.psc.wp.gov.lk</u> වන අපගේ වෙබ් අඩවිය මගින් ප්‍රවේශ පත්‍ර බාගත කර ගත හැක. ඒ පිළිබඳව විභාගයට සති දෙකකට පමණ පෙර අපේක්ෂකයින් හට කෙටි පණිවිඩයක් මගින් දන්වනු ලැබේ.

**සටහන: විභාගයට ඇතුලත් කර ගැනීම, විභාගයට පෙනී සිටීමට ඇති යෝග්‍යතාව පිළිගැනීමක් ලෙස සැලකිය යුතු නොවේ.**

05. <u>අපේක්ෂකයන්ගේ අනන්‍යතාව</u>

තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලාධිපතිට අයදුම්කරු තම අනන්‍යතාව ඒත්තු ගැන්විය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් පිළිගනු ලැබේ.

1. වලංගු හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය
3. වලංගු රියදුරු බලපත්‍රය

**සටහන : විභාග ශාලාවේදී සිය අනන්‍යතාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.**

06. **අසත්‍ය තොරතුරු සැපයීම සම්බන්ධයෙන් දඬුවම්**

1. සියළුම අපේක්ෂකයන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව මෙම විභාගය සඳහා ඔවුන් සඳහන් කර ඇති සියළු සුදුසුකම් සම්පූර්ණ කළාසේ සලකා විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

2. මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව, විභාගය පැවැත්වෙද්දී හෝ ඉන්පසුව කවර අවස්ථාවකදී වුවද, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයෙකු විසින් දැන දැනම අසත්‍ය තොරතුරු සපයා ඇති බව හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කල බව පෙනී ගිය හොත් ඔහු/ඇය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහ කිරීමට ඉඩ තිබේ. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීති උල්ලංඝණය කිරීම වෙනුවෙන් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබිය හැකි ඕනෑම දඬුවමකට යටත් වෙයි.

07. **විභාග ගාස්තු**

පළමු වතාවට මෙම විභාගය අයදුම්කරන අයදුම්කරුවන් විභාග ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ. ඉන්පසුව විභාගයට අයදුම්කරන අපේක්ෂකයන් විභාග ගාස්තු ලෙස, **සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේනම් රු 500 /- ක්ද, විෂයයන් දෙකක් සඳහා පෙනී සිටින්නේ නම් රු.400/-** ක්ද, **එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු.300/-** ක්ද බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ **20-03-02-99** ට බැර වන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද බ.ප **1** ලදුපත අයදුම්පත්‍රයට නොගැලවෙන සේ අමුණා එවිය යුතුය.

08. **විෂය නිර්දේශය**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|
| කාර්යාල ක්‍රම (විෂය අංකය - 01) | රජයේ කාර්යාලවල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම හා රාජකාරී ලිපි ලේඛන මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මඟින් තම අදහස් / නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාවද පරීක්ෂා කෙරේ.<br><br>මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.<br><br>I කොටස - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 25)<br><br>II කොටස - ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් තුනකට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 75 යි) | පැය 02 |
| ගිණුම් ක්‍රම (විෂය අංකය - 02) | රජයේ කාර්යාලවල භාවිතා වන මූලික ගිණුම් හා ගිණුම් ක්‍රම ද මුදල් පාලන පොත්වල කාර්යයන් පිළිබඳවද අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ.<br><br>මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.<br><br>I කොටස - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 25)<br><br>II කොටස - ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් තුනකට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 75) | පැය 02 |
| පරිගණක පරීක්ෂණය (විෂය අංකය - 03) | අයදුම්කරුට පහත සඳහන් හැකියාවන් තිබේදැයි පරීක්ෂා කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ වේ.<br>i. තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්පය<br>ii. වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය | පැය 01 1/2 |

| | | |
|---|---|---|
| | iii. ගොණු කළමනාකරණය<br>iv. වදන් සැකසුම<br>මූලික කුසලතා, තීරයට හුරු වීම, පාඨ සංස්කරණය පාඨ එකේලී කිරීම, අකුරු වර්ග හා උප ලක්ෂණ, අනුච්ඡේද, ඡේද පේළි අතර පරතරය වෙනස් කිරීම, පිමි අනුයෝගය (Tab Setting) පාඨයක් සෙවීම හා ප්‍රතිෂ්ඨාපනය, අක්ෂර හා ව්‍යාකරණ දෝශ, සමානාර්ථ පද, තීරු යෙදීම, පිටුව සැකසීම, ලේඛන මුද්‍රණය, වගු නිර්මාණය, අනුපිළිවෙලට සැකසීම, ගොණු කළමනාකරණය ලේඛනයක් ලිපින කීපයකට යැවීමට සැකසීම, මැක්‍රෝ භාවිතය.<br>v. පැතුරුම් පත්<br>මූලික කුසලතා<br>ආකෘතිකරණය (Formatting)<br>සංස්කරණය<br>තීරු හා පරාස, නව ඇතුලත් කිරීම හා ඉවත් කිරීම<br>දත්ත අනුපිළිවෙළට සැකසීම<br>ප්‍රස්ථාර සැකසීම<br>මුද්‍රණය<br>@ ශ්‍රිතය (@ Function)<br>මැක්‍රෝ භාවිතය<br>ගොණු කළමනාකරණය<br>vi. අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල<br>අන්තර්ජාලය හැඳින්වීම, මූලික කුසලතා, විද්‍යුත් තැපැල ලබා ගැනීම<br>විද්‍යුත් තැපැල යැවීම, ඊට ප්‍රතිචාර දැක්වීම<br>ඇමුණුම භාවිතය, ලිපිනය හඳුනාගැනීමට කෙටි නාම භාවිතය<br>පණිවුඩ සම්පාදනය<br><br>මෙම ප්‍රශ්න පත්‍රය <u>කොටස් දෙකකින් යුක්ත වේ.</u><br><br>I කොටස - බහුවර්ණ/කෙටි පිළිතුරු ප්‍රශ්න 40කින් යුක්ත වේ. කාලය මිනිත්තු 45යි. (ලකුණු 40)<br><br>II කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 05කි. කාලය මිනිත්තු 45යි. (ලකුණු 60) | |

**09.** මෙම විභාගය සඳහා අයදුම්කරන නිලධාරීන් තමන් කැමති වන්නේ නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට නිලධාරීන්ට හැකි වේ. එනෙකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂය සඳහා වූ මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) නිලධාරීන් විසින් ලබාගත යුතුවේ.

**10 .** අවශ්‍ය වුවහොත් මෙම විභාගය සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම පවත්වනු ලැබේ. අපේක්ෂකයින් විසින් තමා පෙනී සිටින සියළුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයිය යුතුය.

**11.** මෙම විභාග නිවේදනයට අනුව විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
2025.11.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

Tel - 0112879614
Fax – 0112879512
Email – ppscwprec@sltnet.lk